පන්නල ප්‍රාදේශීය සභාව - 2024

----

1. මූල්‍ය ප්‍රකාශන

1.1 අභිතකර මතය

පන්නල ප්‍රාදේශීය සභාවේ 2024 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය ,ශුද්ධ වත්කම් /ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10(1) උපවගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මාගේ වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත් බව හේතුවෙන් 2024 දෙසැම්බර් 31 දිනට පන්නල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 අභිතකර මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අභිතකර මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ අභිතකර මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 විගණන විෂය පථය

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන, සැකසීමෙන් චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව්කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදකවූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව්කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්‍ාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට රු.67,865,702 ක් වූ තැන්පතු ශේෂය රු.53,964,109 ලෙස රු.13,901,593 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.	2025 මූල්‍ය ප්‍රකාශන මගින් නිවැරදි කරන බව.	වටිනාකම් හඳුනාගෙන නිවැරදිව ගිණුම්ගත කිරීම කළ යුතුය.
(ආ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සේවක ණය ශේෂය රු.16,574,228 ක් වුවද එය රු.13,315,865 ක් ලෙස රු.3,258,363 අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.	2025 මූල්‍ය ප්‍රකාශන මගින් නිවැරදි කරන බව.	නිවැරදිව ගිණුම්ගත කිරීම කළ යුතුය.
(ඇ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මෝටර් රථ හා කරත්තවල වටිනාකම රු.94,630,000 ක් වුවත් එය රු.101,082,500 ක් ලෙස රු.6,452,500 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි.	2025 මූල්‍ය ප්‍රකාශන මගින් නිවැරදි කරන බව.	නිවැරදිව ගිණුම්ගත කිරීම කළ යුතුය.
(ඈ)	සභාවට අයත් උප කාර්යාල 04 හි සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට තැන්පතු ශේෂය වූ රු.4,841,049 ක් මූල්‍ය ප්‍රකාශන තුලට ඇතුලත් කර නොතිබුණි.	2025 මූල්‍ය ප්‍රකාශන මගින් නිවැරදි කරන බව.	නිවැරදිව ගිණුම්ගත කිරීම කළ යුතුය.
(ඉ)	සමාලෝචිත වර්ෂය තුලදී මිලදී ගනු ලැබූ රු.1,172,794 ක් වූ ලී බඩු උපකරණ වටිනාකම මූල්‍ය ප්‍රකාශනවලට ඇතුලත් කර නොතිබුණු අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ආයුර්වේද ඖෂධ තොගය රු.322,764 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.	2025 අවසන් ගිණුම තුලින් නිවැරදි කිරීමට කටයුතු කරන බව.	නිවැරදිව ගිණුම්ගත කිරීම කළ යුතුය.
(ඊ)	සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට රු.1,286,255 ක ස්ථාවර තැන්පතු පොළී, ආදායමක් ලෙස හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි.	2025 මූල්‍ය ප්‍රකාශන මගින් නිවැරදි කරන බව.	ආදායම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය.

1.6.2 නොසැසඳුණු පාලන ගිණුම් හෝ වාතර්‍ා

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	විගණනය වෙත ලබා දුන් තොරතුරු අනුව වත්කම් විෂයයන් 02 ක උපලේඛන අනුව ශේෂය රු.223,214,271 ක් හා මූල්‍ය ප්‍රකාශනය අනුව ශේෂය රු.390,563,490 වීමෙන් එම ශේෂ අතර රු.167,349,219 ක වෙනසක් පැවතුණි.	2025 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මගින් නිවැරදි කරන බව.	ලේඛන නිවැරදි කර ඒ අනුව ගිණුම්ගත කිරීම කළ යුතුය.
(ආ)	විගණනය වෙත ලබා දුන් තොරතුරු අනුව වත්කම් විෂයයන් 04 ක හා ආදායම් විෂයයන් 02 ක ඒකාබද්ධ ප්‍රා.ස. 07 ප්‍රකාශය අනුව ශේෂය රු.375,799,701 ක් හා මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය රු.740,027,284 වීමෙන් එම ශේෂ අතර රු.364,227,583 ක වෙනසක් පැවතුණි.	2025 මූල්‍ය ප්‍රකාශන මගින් නිවැරදි කරන බව.	වාර්තා යාවත්කාලීනව පවත්වාගෙන ඒ අනුව ගිණුම් පිළියෙල කළ යුතුය.
(ඇ)	විගණනය වෙත ලබා දුන් තොරතුරු අනුව වැය විෂයයන් 08 ක ඒකාබද්ධ වැය සාරාංශය අනුව ශේෂය රු.253,503,437 ක් හා මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය රු.332,952,802 වීමෙන් එම ශේෂ අතර රු.79,449,365 ක වෙනසක් පැවතුණි.	2024 වර්ෂයට අදාල ගෙවීම් කරන ලද නමුත් 2025 වර්ෂයේ ණයහිමි යටතේ වෙන්කර ඇති බැවින් මෙම වෙනස සිදු වී ඇති බව.	නිවැරදි වටිනාකම් හඳුනාගත යුතුය.

1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොමැතිවීම

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
වටිනාකම රු.14,894,050 ක් වු වත්කම් විෂයන් 03 ක් සඳහා ලේඛන හා උප ලේඛන නොමැති වීම හේතුවෙන් විගණනයේ දී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.	ඉදිරියේදී නිවැරදි කිරීමට අවශ්‍ය පියවර ගන්නා බව.	සියළුම වත්කම් සම්බන්ධයෙන් උපලේඛන යාවත්කාලීනව පවත්වාගතයුතුය.

1.7 අනුකූල නොවීම

1.7.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

	නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව	අනුකූල නොවීම	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනත			
(i)	134 වගන්තිය	පළාත් පාලන ආයතනය සඳහා උපරිම වරිපනම් බදු ප්‍රමාණයක් ලබා ගැනීම පිණිස දියුණු කල ගම්	දියුණු කළ ගම් ප්‍රදේශ හඳුනාගෙන ඉදිරියේදී වරිපනම් බදු අය කිරීමට කටයුතු කරන බව.	දියුණු කළ ගම් ප්‍රදේශ හඳුනාගෙන සභාවේ ආදායම

		ප්‍රදේශ හඳුනාගෙන ප්‍රකාශයට පත් කිරීමට කටයුතු කර නොතිබුණි.		වැඩිකර ගැනීමට ක්‍රියා කළ යුතුය.
(ii)	143 වගන්තිය	සභා වරිපනම් බල ප්‍රදේශය ඇතුලත සිදු කල නව ඉදිකිරීම් වෙනුවෙන් තාවකාලික තක්සේරුවක් සිදු කර වරිපනම් අයකල යුතු බව දක්වා තිබුණද එපරිදි කටයුතු කර නොතිබුණි.	සභා වරිපනම් බල ප්‍රදේශය ඇතුලත සිදු කල නව ඉදිකිරීම් වෙනුවෙන් තාවකාලික තක්සේරුවක් සිදු කර වරිපනම් අය කිරිමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව.	පනතේ ප්‍රතිපාදන අනුව කටයුතුකර ආදායම් වැඩිකර ගැනීමට ක්‍රියා කළ යුතුය.
(ආ)	2018 අංක 19 දරණ ජාතික විගණන පනත VII වන පරිච්ඡේදයේ 38(2) වගන්තිය	මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් පවත්වාගෙන යනු ලබන බවටත් එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳ කලින් කළ සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කර ඒ පිළිබඳව ප්‍රධාන ගණන් දීමේ නිලධාරී විසින් ඉටුකළ යුතු ලිඛිත සමාලෝචනයේ පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ආයතනය තුල ගනු ලැබූ බව හා ඉදිරියේදී විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව.	අභ්‍යන්තර පාලනය කාලීනව සමාලෝචනයට ලක් කර සභාවේ කටයුතු විධිමත් කළ යුතුය.
(ඇ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය			
(i)	මුදල් රෙගුලාසි 371	අදාල කාර්යය නිම වූ වහාම අත්තිකාරම් පියවිය යුතු වුවත් 1988 වර්ෂයේ සිට පැවත එන රු.1,716,599 ක නොපියවූ අත්තිකාරම් ශේෂයක් පැවතුණි.	මෙම මුදලින් රු.1,467,376 ක මුදලක් මේ වන විට පියවා ඇති අතර ඉතිරි මුදල වන රු.249,223 ක් පියවා ගැනීමට කටයුතු කරන බව.	අදාල කාර්යය නිමවූ වහාම අත්තිකාරම් පියවිය යුතුය.
(ii)	මුදල් රෙගුලාසි 571 (2)	වටිනාකම රු.42,963,506 ක් වූ කල් ඉකුත් වූ තැන්පතු 1,194 ක් නියාදනය කිරීමට කටයුතු කර නොතිබුණි.	කල් ඉකුත් වූ තැන්පතු වලින් මේ වන විට රු.4,509,480 ක තැන්පතු ප්‍රමාණයක් ආදායමට ගෙන ඇති අතර ඉදිරියේදී ඉතිරි තැන්පතු නිදහස් කිරීමට කටයුතු කරන බව.	කල් ඉකුත් වූ තැන්පතු නිදහස් කිරීමට හා හිමිකම් නොපාන තැන්පතු රාජ්‍ය ආදායමට බැර කිරීමට කටයුතු කළ යුතුය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කර තිබුණු මූල්‍ය ප්‍රකාශන අනුව 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.106,664,766 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.77,462,461 ක් විය.

2.3 ආදායම් පරිපාලනය

2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සභා ලේකම්වරයා විසින් සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

	2024 වර්ෂය				2023 වර්ෂය			
ආදායම් ප්‍රභවය	**ඇස්තමේන්තු ගත ආදායම**	**බිල්කළ ආදායම**	**රැස්කළ ආදායම**	**දෙසැම්බර් 31 දිනට මුළු හිඟය**	**ඇස්තමේන්තු ගත ආදායම**	**බිල්කළ ආදායම**	**රැස්කළ ආදායම**	**දෙසැම්බර් 31 දිනට මුළු හිඟය (බිල් කළ ආදායමින්**
	(රු.000)	(රු.000)	(රු.000)	(රු.000)	(රු.000)	(රු.000)	(රු.000)	(රු.000)
වරිපනම් හා බදු	16,305	14,546	13,193	3,957	15,263	11,025	8,890	2,604
කුලී	36,044	36,313	34,062	7,369	33,841	30,527	27,927	5,118
බලපත්‍රගාස්තු	1,732	1,100	1,100	-	1,551	1,522	1,522	-
වෙනත්ආදායම්	256,891	310,948	310,948	-	8.857	1,603	1,603	-
	----------	------------	-----------	----------	-----------	------------	----------	----------
එකතුව	310,972	362,907	359,303	11,326	59,512	44,667	39,942	7,722
	=======	=======	=======	======	=======	=======	======	======

2.3.2 ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය

	විගණන නිරීක්ෂණය	**සභාවේ අදහස් දැක්වීම**	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 310 ක ආදායමක් රැස් කිරීමට ඇස්තමේන්තු කර තිබුණු අතර පෙර වර්ෂයට අදාල හිග ආදායම වූ රු.මිලියන 7.7 ක් ඇතුළුව රු.මිලියන 359 ක් රැස්කර තිබුණි. ඒ අනුව ආදායම් ඇස්තමේන්තු සැකසීමේ දී තාත්විකව සකස් කර නොතිබුණි.	2025 වර්ෂයේ ආදායම් ඇස්තමේන්තු සැකසීමේ දී තාත්විකව සැකසීමට කටයුතු කරන බව.	නිවැරදි ආදායම් ඇස්තමේන්තු සකස්කර මුදල් සඵලදායීව උපයෝජනයට ක්‍රියා කළ යුතුය.

(ආ) **වරිපනම් බදු**

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.3,428,153 ක හිඟ වරිපනම් බදු ශේෂය තුළ වසර 1 ත් 5 ත් අතර කාලයට අදාලව රු.3,097,938 ක් ද අවුරුදු 05 ට වැඩි රු.330,215 ක් ද අය නොවී පැවතුණි.	2024 දෙසැම්බර් 31 දිනට පැවති රු.4,713,122 ක හිඟ වරිපනම් මුදලින් 2025 මාර්තු 31 වන විට රු.3,668,604 ක මුදලක් අයවී ඇති අතර එම ප්‍රතිශතය සියයට 77.84 ක් පමණ වන බව.	හිඟ ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.

(ඇ) **කුලී**

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.7,368,695 ක හිඟ කඩ කුලී ශේෂයක් අයකර ගෙන නොතිබුණි.	හිඟ මුදල් අය කරගැනිමට කටයුතු කරන බව.	හිඟ ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.

3. මෙහෙයුම් සමාලෝචනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳව කාරණා විධිමත් කිරිම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යන් ඉටු කිරීම පිළිබඳ අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

3.1 පනතින් පවරි ඇති කාර්යයන් ඉටු කිරීම

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 30 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය හැකිව තිබූ නමුත් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් සභාව විසින් අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි.	අතුරු ව්‍යවස්ථා පැනවිම සඳහා ඉදිරියේ දී කටයුතු කරන බව.	ප්‍රාදේශීය සභා පනතේ ප්‍රතිපාදන මත කටයුතු කර සභාවේ කටයුතු නියාමනය කිරීමට ක්‍රියා කළ යුතුය.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති රු.86,501,678 ක ලැබිය යුතු ගිණුම් ශේෂ 05 ක් තුළ වර්ෂ 1 ත් 5 ත් අතර කාලයට අදාලව රු.84,219,006 ක් හා අවුරුදු 05 ට වැඩි කාලයට අදාලව රු.1,493,378 ක ශේෂයක් පැවතුණි.	හිඟ බදුශේෂ අයකර ගැනීමට කටයුතු කරන බව.	ලැබිය යුතු ශේෂ කඩිනමින් අයකරගැනීමට ක්‍රියා කළ යුතුය.
(ආ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් 04 ක එකතුව රු.261,779,853 ක් වූ අතර ඒ තුල වර්ෂ 1 ත් 5 ත් අතර කාලයට අදාලව රු.180,200,681 ක ශේෂයක් පැවතුණි.	ආපසු ගෙවිය යුතු තැන්පත් නිදහස් කිරීමට කටයුතු කරන බව.	ගෙවිය යුතු ශේෂවල පැවැත්ම පිළිබඳව අවධානය යොමුකර නිරවුල් කිරීමට ක්‍රියා කළ යුතුය.

(ඇ)	2024 වර්ෂය තුළ අනවසර ඉදිකිරීම් සම්බන්ධයෙන් ලැබී තිබුණු පැමිණිලි 16 න් පැමිණිලි 05 ක් සම්බන්ධයෙන් ගත් ක්‍රියාමාර්ග මොනවාද යන්න පිළිබඳව පසු විපරම් කර නොතිබුණි.	2024 වර්ෂයේ අනවසර ඉදිකිරීම් සම්බන්ධව අදාල පාර්ශවයන් දැනුවත් කර ගතයුතු ක්‍රියාමාර්ග පිළිබඳව දැනුවත් කර ඇති බව.	අනවසර ඉදිකිරීම් නියාමනය කර සභාවේ කටයුතු විධිමත් කළ යුතුය.

3.3 වත්කම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සභාව විසින් නඩත්තු කරනු ලබන සුසාන භූමි 117 න් 71 ක් සහ සභාව සතු කැබ් රථයේ අයිතිය සභාව වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.	පැවරුම් නියෝග ලබා ගැනිම වෙනුවෙන් අප විසින් ඉල්ලීම් ඉදිරිපත් කර ඇති අතර තවත් සුසානභූමි 11 ප්‍රමාණයක් සම්බන්දයෙන් කරුණු පරික්ෂා කර තහවුරු කිරිම සිදු කරමින් පවතින බව.	වත්කම්වල අයිතිය තහවුරු කර ගැනීමට කටයුතු කළ යුතුය.
(ආ)	සභාව සතු ස්කැවේටර් යන්ත්‍රය, 2020 මාර්තු 10 දින පැවති මහ සභාව විසින් වෙන්දේසි කිරීමට තීරණය කර තිබුණද 2025 පෙබරවාරි 20 වන විටත් යන්ත්‍රය වෙන්දේසි කිරීමට ක්‍රියාකර නොතිබුණි.	මෙය නිවැරදි කිරීමට කටයුතු කරන බව.	අපහරනය සඳහා නිර්දේශ කර ඇති වත්කම් කඩිනමින් අපහරනය කළ යුතුය.
(ඇ)	රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂකගේ 2005 පෙබරවාරි 18 දිනැති ලිපිය මගින් පන්නල ප්‍රාදේශීය සභාව වෙත ලබා දී තිබුණු ගිනි නිවන රථය සභාවට පවරාගෙන නොතිබුණු අතර ලැබුණ දින සිටම නිෂ්ක්‍රියව පැවතුණි.	මෙම පවරා ගැනීමේ ක්‍රියාවලිය ඉදිරියේදී සිදුකර ගැනීමට කටයුතු කරන බව.	වත්කම් ඵලදායීව උපයෝජනය කර ගත යුතුය.
(ඈ)	සභාව සතු වාහන 14 ක් සඳහා සමාලෝචිත වර්ෂයේදී වාර්ෂික බලපත්‍ර ලබාගෙන නොතිබුණි. ඉන් වාහන 06 ක් සඳහා අවසන් වරට වාර්ෂික බලපත්‍ර ලබාගත් දිනයද හඳුනා ගැනීමට නොහැකි වී තිබුණු අතර වාහන 08 ක් සඳහා අවුරුදු 2-4 අතර කාලයකට වාර්ෂික බලපත්‍ර ලබාගෙන නොතිබුණි.	අදහස් දක්වා නොතිබුණි.	සියලුම වාහන සඳහා වාර්ෂික බලපත්‍ර ලබා ගැනීමට ක්‍රියා කළ යුතුය.

3.4 ව්‍යාපෘති, කතර්ව්‍යයන් හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
වටිනාකම රු. 16,435,000 ක් වූ ප්‍රතිපාදන සලසා තිබුණු ව්‍යාපෘති 19 ක් සමාලෝචිත වර්ෂය තුළදී ආරම්භ කර හෝ නොතිබුණි.	අධික වර්ෂාව සහත කාලගුණික තත්වය නිසා සමාලෝචිත වර්ෂයෙදී නිම කළ නොහැකි වුවත් මේවන විට ඉටුකරමින් පවතින බව.	මහජන මුදල් උපරිම කාර්යක්ෂමව උපයෝජනය කළ යුතුය.

3.5 මානව සම්පත් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සභාවේ අනුමත කාර්ය මණ්ඩලයේ තනතුරු 15 ක පුරප්පාඩු 29 ක් පැවති අතර, ඉන් සභාවේ අනිවාර්යයෙන්ම සිටිය යුතු තනතුරු වන ආදායම් පරීක්ෂක, පෙර පාසල් ගුරු, පුස්තකාලයාධිපති හා වැඩ පරීක්ෂක යන තනතුරුවල පුරප්පාඩු විශාල වශයෙන් පැවතුණි.	ආදායම් පරීක්ෂක, පෙර පාසල් ගුරු, පුස්තකාලයාධිපති හා වැඩ පරීක්ෂක යන තනතුරුවල බඳවාගැනීම රාජ්‍ය සේවා කොමිෂන් සභාව හරහා ක්‍රියාත්මක බැවින් මේ පිළිබඳව දැනුවත් කර ඇති බව.	සේවක පුරප්පාඩු සපුරාගෙන සභාවේ කාර්යයන් විධිමත් පරිදි ඉටු කළ යුතුය.
(ආ)	මිය ගිය නිලධාරියෙකුගෙන් රු.98,605 ක් සහ සේවය හැර ගිය නිළධාරීන් දෙනෙකුගෙන් රු.304,434 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයකරගත යුතුව පැවතුණි.	එක් නිලධාරියකුගේ ණය ශේෂය නොඉල්ලුමට ඉදිරිපත් කර ඇති අතර සේවය හැර ගිය නිලධාරීන් දෙදෙනාගේ ඇපකරුවන්ගෙන් මාසිකව වැටුපෙන් අය කරමින් පවතින බව.	ගිවිසුම් ප්‍රකාරව ණය මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
සභාව විසින් සමාලෝචිත වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2025 පෙබරවාරි 25 දින ඉදිරිපත් කර තිබුණද එහි අවිනිශ්චිත ගිණුමේ රු.345,449,441 ක ශේෂයක් පැවතීම සහ ඇතැම් ගනුදෙණු සටහන් නොකිරීම හේතුවෙන් 2025 මැයි 21 දින මූල්‍ය ප්‍රකාශන ආපසු භාරගත් අතර නැවත සංශෝධනය කර 2025 ජූලි 14 දින ඉදිරිපත් කර තිබුණි.	විගණනය විසින් පෙන්වාදුන් කරුණු පිළිගන්නා බව.	නිවැරදිව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නියමිත දිනට ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය.

4.2 වාෂර්ක ක්‍රියාකාරී සැලැස්ම

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
වාර්ෂික අයවැය මඟින් රු.80,940,000 ක ප්‍රතිපාදන සලසා තිබුණු වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ ඇතුලත් කර්මාන්ත 14 ක් ඉටු කර නොතිබුණි.	සියළුම ව්‍යාපෘති මේවන විට ආරම්භ කර ඇති බව.	මහජන මුදල් උපරිම කාර්යක්ෂමව උපයෝජනය කිරීමට ක්‍රියා කළ යුතුය.

4.3 අයවැය පාලනය

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
සමාලෝචිත වර්ෂයේ ආදායම් විෂයයන් 08 ක ඇස්තමේන්තුගත හා සත්‍ය ආදායම් අතර සියයට 01 සිට සියයට 94 දක්වා සහ වියදම් විෂයයන් 09 ක ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය හා සත්‍ය වියදම අතර සියයට 01 සිට සියයට 76 දක්වා විචලනයක් පැවතුණි. ඒ අනුව අයවැය ලේඛනය ඵලදායී කලමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණි.	විගණනයෙන් පෙන්වා දුන් අඩුපාඩු අවම වන පරිදි අයවැය සඳහා තාත්වික ඇස්තමේන්තු සකසා ගැනීමට පියවර ගන්නා බව.	අයවැය ලේඛනය ආයතනයේ කළමනාකරණයට සහය වන පාලන කාරකයක් ලෙස භාවිතා කිරීමට හැකි වන පරිදි සකස් කළ යුතුය.